ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2020 ජූලි මස 09 දින** |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: 2020 ජූලි

### ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරයි

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2020 ජූලි 08 වැනි දින පැවති රැස්වීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා පදනම් අංක 100කින් අඩු කිරීමට තීරණය කළේය. වෙළඳපොළ ණය අනුපාතික තවදුරටත් පහළ හෙලීම මගින් ආර්ථිකයේ ඵලදායී අංශ වෙත කඩිනමින් ණය ලබා දීම සඳහා මූල්‍ය පද්ධතිය දිරිමත් කිරීමේ අරමුණින් යුතුව අඩු උද්ධමනයක් පවතින වාතාවරණයක් යටතේ මුදල් මණ්ඩලය මෙම තීරණයට එළඹිණි. එමගින් කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා මෙන්ම පුළුල් ආර්ථිකයට වන සහාය වඩාත් ශක්තිමත් කෙරෙනු ඇත.**

කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය තුළින් ගෝලීය වශයෙන් කෙටි කාලීන වර්ධන අපේක්ෂාවන් කෙරෙහි දැඩි ලෙස බලපෑම් එල්ල කර ඇති අතර, මේ දක්වා දක්නට

ලැබෙන ආර්ථික දත්තයන්ට අනුව 2020 වසරේ දෙවන කාර්තුව තුළදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහිද එමගින් දැඩි බලපෑමක් ඇතිකර ඇතැයි පෙන්නුම් කෙරේ. මුදල් හා රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ගවල සහාය සමඟ වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, මැදි කාලීනව ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා ආර්ථික වර්ධනය ඉහළ නැංවෙන සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කෙරෙන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම අත්‍යවශ්‍ය වේ.

විදේශීය අංශය සලකා බැලීමේදී, අපනයන ආදායමේ පහළ යෑම ඉක්මවා සිදු වූ ආනයන වියදමේ අඩුවීමත් සමඟ, 2020 වසරේ මුල් මාස පහ තුළ වෙළෙඳ හිඟය අඩු වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 2020 මාර්තු මාසයේ මැද සිට අප්‍රේල් මාසයේ මැද දක්වා කෙටි කාලයක් තුළ අස්ථාවර වූ විනිමය අනුපාතිකය, විදේශ විනිමය පිටතට ගලා යෑම් වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් ඉන් අනතුරුව සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය. 2020 ජූනි අවසානය වනවිට දළ නිල විදේශ සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.7ක් වූ අතර, එය මාස 4.2ක ආනයන ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් වේ.

ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩුකිරීම්වල බලපෑම සහ දේශීය මුදල් වෙළඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාව පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව පහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසරේ මේ දක්වා කාලය තුළදී ගනු ලැබූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් හා සැසඳීමේ දී වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ යෑමේ වේගය පිළිබඳ සෑහීමට පත් විය නොහැක. බැංකුවල ඉහළ අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතියද, පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2020 මැයි මාසයේදී සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, ණය පොලී අනුපාතිකයන්ගේ අපේක්ෂිත සීඝ්‍ර අඩුවීම සහ කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා සහාය වීමට හඳුන්වා දී ඇති ඉතා සහනදායී ණය යෝජනා ක්‍රමවල සහාය ලබමින් ඉදිරි කාල සීමාව තුළදී පෞද්ගලික අංශයට ලබා දෙන ණය ඉහළ යනු ඇත. මේ අතර, රාජ්‍ය අංශයට ලබාදුන් ණයෙහි සැලකිය යුතු ලෙස ඉහළ යෑම 2020 වසරේ පළමු මාස පහ තුළදී දේශීය ණයෙහි ඉහළ යෑමට මෙන්ම සමස්ත මුදල් සැපයුම ඉහළ යෑම සඳහා හේතු විය.

ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, මුදල් මණ්ඩලය 2020 ජූලි මස 08 වැනි දින පැවති රැස්වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), 2020 ජූලි 09 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා පදනම් අංක 100කින් අඩු කිරීමට තීරණය කරන ලදී. 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල සිදුකරන ලද පදනම් අංක 250ක සමස්ත පහළ දැමීමෙහි සම්පූර්ණ ප්‍රතිලාභ ආර්ථිකය වෙත ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතු බවට මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු ප්‍රමුඛ සියලුම මූල්‍ය ආයතන වෙත නැවතත් අවධාරණය කර සිටී. තවද, බැංකුවල අරමුදල් පිරිවැය ද අඩු කරමින්, වසරේ මේ දක්වා කාලය තුළදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පදනම් අංක 300කින් අඩු කිරීම මගින් වැඩි දියුණු වූ ද්‍රවශීලතා මට්ටම් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයේ ණය ලබාගන්නන් වෙත මුදා හරිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ අවශ්‍යතා සහිත අංශ සඳහා සහාය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් නිවේදනය කර ඇති සහනදායී ණය වැඩසටහන් සමඟ ආර්ථිකයේ ඵලදායී අංශ වෙත ණය ලබා දීම සඳහා මෙම අතිරේක ද්‍රවශීලතාව භාවිතා කළ යුතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය සහ ගෝලීය සාර්ව ආර්ථික සහ මූල්‍ය වෙළෙඳපොළ ප්‍රවණතා අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබන අතර, දැනටමත් ක්‍රියාත්මක කර ඇති ප්‍රතිපත්තිවල අපේක්ෂිත ප්‍රතිඵල සහතික කිරීම සඳහා අවශ්‍ය වන වැඩිදුර පියවර ඉදිරියේදී ගනු ලබනු ඇත.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කරන ලද අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 5.50 |
| බැංකු අනුපාතිකය (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සමඟ ස්වයංක්‍රීයව ගලපන ලද ) | සියයට 8.50 |

| | |
|---|---|
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 2.00 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් 2020 ජූලි මස 09 වැනි දින පෙ.ව. 11.00 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්ථාගාරයේදී මාධ්‍ය හමුවක් පැවැත්වේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2020 අගෝස්තු මස 20 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**දත්ත ඇමුණුම:**

**සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)**

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | | | | | 2019 | | | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කෘෂි කාර්මික** | 5.9 | 6.6 | 5.1 | 8.2 | **6.5** | 5.0 | 1.5 | 1.0 | -4.1 | **0.6** |
| **කර්මාන්ත** | 1.6 | 3.5 | 3.5 | -3.4 | **1.2** | 3.9 | 1.6 | 3.5 | 1.4 | **2.7** |
| **සේවා** | 5.1 | 4.6 | 4.4 | 4.2 | **4.6** | 3.7 | 0.7 | 2.1 | 2.7 | **2.3** |
| **ද.දේ.නි** | **3.8** | **4.0** | **3.7** | **1.9** | **3.3** | **3.7** | **1.1** | **2.4** | **2.0** | **2.3** |

*මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**සංඛ්‍යා සටහන 02: උද්ධමනය**

| මාසය | | නොවැ-19 | දෙසැ-19 | ජන-20 | පෙබ-20 | මාර්-20 | අප්‍රේ- 20 | මැයි- 20 | ජූනි- 20 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 4.4 | 4.8 | 5.7 | 6.2 | 5.4 | 5.2 | 4.0 | 3.9 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.1 | 6.2 | 7.6 | 8.1 | 7.0 | 5.9 | 5.2 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය %** | කො.පා.මි.ද. (2013=100) | 5.1 | 4.8 | 3.0 | 3.2 | 2.9 | 3.1 | 2.9 | 3.1 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වෙනස)** | ජා.පා.මි.ද. (2013=100) | 5.5 | 5.2 | 3.9 | 3.4 | 3.2 | 3.2 | 3.7 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| **දර්ශකය** | **ප්‍රමාණය (රුපියල් බිලියන)** | | | | | **වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස** | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **ජන-20** | **පෙබ-20** | **මාර්-20** | **අප්‍රේ-20** | **මැයි-20** | **ජන-20** | **පෙබ-20** | **මාර්-20** | **අප්‍රේ-20** | **මැයි-20** |
| සංචිත මුදල් | 936 | 963 | 1,014 | 1,022 | 997 | -1.4 | 0.0 | 5.3 | 10.5 | 17.3 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 7,704 | 7,793 | 8,098 | 8,259 | 8,293 | 8.3 | 8.4 | 11.6 | 13.2 | 13.7 |
| ශුද්ධ විදේශීය වත්කම් | 117 | 127 | 63 | 119 | -15 | 196.4 | 232.5 | 104.8 | 0.6 | -113.5 |
| ශුද්ධ දේශීය වත්කම් | 7,587 | 7,666 | 8,036 | 8,140 | 8,308 | 4.9 | 5.2 | 11.3 | 13.4 | 15.6 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 2,886 | 2,928 | 3,199 | 3,264 | 3,428 | 9.9 | 9.5 | 22.4 | 26.2 | 32.1 |
| රාජ්‍ය සංස්ථා සඳහා ලබා දුන් ණය | 820 | 833 | 868 | 934 | 953 | 15.3 | 16.5 | 23.6 | 28.7 | 31.1 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 5,799 | 5,824 | 5,944 | 5,958 | 5,888 | 4.5 | 4.8 | 6.5 | 7.6 | 6.4 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 9,573 | 9,676 | 9,973 | 10,160 | 10,196 | 9.5 | 9.6 | 12.0 | 13.3 | 13.6 |

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2020 ජන අවසානයට** | **2020 පෙබ අවසානයට** | **2020 මාර් අවසානයට** | **2020 අප්‍රේ අවසානයට** | **2020 මැයි අවසානයට** | **2020 ජූනි අවසානයට** | **2020 ජූලි 08 දිනට** |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 6.50 | 6.50 | 6.25 | 6.00 | 5.50 | 5.50 | 5.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 7.50 | 7.50 | 7.25 | 7.00 | 6.50 | 6.50 | 6.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 6.98 | 6.95 | 6.75 | 6.40 | 5.84 | 5.52 | 5.51 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 7.51 | 7.42 | 7.00 | 6.75 | 6.69 | 5.50 | 5.08 |
| දින 182 | 8.15 | 8.06 | 7.25 | 6.80 | 6.82 | 5.53 | 5.18 |
| දින 364 | 8.59 | 8.58 | 7.50 | 7.00 | 6.93 | 5.66 | 5.32 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 9.68 | 9.47 | 9.24 | 9.49 | 9.16 | 8.48 | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.47 | 13.36 | 13.22 | 13.08 | 12.96 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 12.53 | 12.54 | 12.19 | 11.67 | 11.68 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.14 | 8.06 | 7.90 | 7.77 | 7.57 | 7.38 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 9.97 | 9.83 | 9.65 | 9.51 | 9.26 | 9.00 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 9.34 | 8.55 | 8.22 | 7.83 | 7.83 | - | - |

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*